සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 06 | විෂයය / பாடம் / Subject: පෙරදිග සංගීතය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 1 1/2 |

නම :- ...................................................................................... විභාග අංකය :- ..........................

## I කොටස

සැලකිය යුතුයි:
* ප්‍රශ්න අංක 1 සිට 20 දක්වා ඇති සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

❖ දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

(01) ස්වර දෙකක් පමණක් යොදා ගනිමින් තනුව නිර්මාණය වූ ගීතයක් වනුයේ,

(1) හොඳ දේ හිතමි (2) එකට සතුටු සාගරේ
(3) කඳු පෙළ අතරේ (4) මුනිසිරිපාදේ

(02) "සුවඳ පත්ම ඕලු ආදී" යන ගීතය කිනම් වර්ගයකට අයත් ගීතයක් ද?

(1) ළමා ගීයකි. (2) ස්වර ස්ථාපන ගීයකි.
(3) නූර්ති ගීයකි. (4) කෙළි ගීයකි.

(03) 'ධ' ස්වරය බටහිර සංගීතයට අනුව ගායනා කිරීමේ දී කිනම් අයුරකින් ගැයේ ද?

(1) Do (2) Fa (3) La (4) Ti

(04) "සුසිර" වර්ගයට අයත් සංගීත භාණ්ඩයක් වනුයේ,

(1) වයලීනය (2) සිතාරය (3) ගිටාරය (4) සර්පිනාව

(05) සරිග, රිගම, මීළඟ ස්වර බන්ධය වනුයේ,

(1) මපධ (2) ගමප (3) ගමධ (4) මපනි

(06) රිගමප යන පෙරදිග සංගීතයේ දී හඳුන්වනු ලබන ස්වර, අපරදිග සංගීතයේ දී හඳුන්වනු ලබන්නේ,

(1) CDEF යනුවෙනි (2) DEFG යනුවෙනි
(3) DFAB යනුවෙනි (4) GDEF යනුවෙනි.

(07) පහත දැක්වෙන භාණ්ඩ අතුරින් ස්වර වාද්‍ය භාණ්ඩයක් නොවන්නේ,

(1) මෙලෝඩිකාව (2) සර්පිනාව
(3) විදුලි ඕගනය (4) තම්මැට්ටම

❖ පහත දැක්වෙන වාක්‍යය නිවැරදි නම් ✓ ලකුණ ද වැරදි නම් × ලකුණ ද යොදන්න.

(08) ඉරෙන් හඳෙන් එළිය අරන් ගීතය ළමා ගීයකි. ( )

(09) දොඩම් කපාලා ඇඹුල් තනාලා, එළුවන් කෑමේ එන ගීයකි. ( )

(10) "ඇහැල මලින් ගස් පිරිලා" නරිබෑණා නාට්‍යයේ එන ගීයකි. ( )

(11) ආනන්ද සමරකෝන් මහතා ජාතික ගීයේ නිර්මාතෘවරයා ය. ( )

(12) දිග එස්ලෝන් බටයකට පිඹීමෙන් ඉහළ හඬක් නිකුත් වේ. ( )

❖ පහත දැක්වෙන වගුවේ **A** තීරුවට කිසියම් ආකාරයකට ගැළපෙන කරුණක් **B** තීරුවේ ඇත. ගැළපෙන කරුණු තෝරා යා කරන්න.

| | A | B |
|---|---|---|
| (13) | උඩින් උඩින් වර පෙත්තප්පු | (අ) ලඝු මාත්‍රා 8ක් ඇත. |
| (14) | සුරතල් නංගියෙ අපෙ අම්මා | (ආ) තුන් සරණේ ගී පාදයකි. |
| (15) | උඩරට මැණිකෙට | (ඇ) රබන් පදයකි. |
| (16) | ගී ගයන මේ කුරුලු යාලුවන් හා | (ඈ) මව්ගුණ වරුණ ගී පාදයකි |
| (17) | සීත ගඟුලෙදි ඇඳ පේවෙනවා | (ඉ) ස්වර ස්ථාපන ගීයකි. |

❖ පහත සඳහන් රූප සටහන් අතුරින් අසා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.


A


B


C


D

(18) කිසිදු අපහසුවකින් තොරව ස්වර වාදනය කළ හැකි භාණ්ඩය කුමක් ද?

..........................................................................

(19) අලුව (BOW) උපයෝගී කරගනිමින් වයන භාණ්ඩය කුමක් ද?

..........................................................................

(20) තාල වාදනය සඳහා යොදා ගනු ලබන භාණ්ඩය කුමක් ද?

..........................................................................

(ලකුණු 1x20=20)

## II කොටස

**සැ.යු. පහත සඳහන් ප්‍රශ්න අතරින් ඔබ කැමැති ප්‍රශ්න 03ක් තෝරා පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට ලකුණු 10බැගින් හිමිවේ.**

(01) (i) ඔබ උගත් මව්ගුණ ගීතයක පද මාලාව ලියන්න. (ලකුණු 04)

(ii) ළමා ගීතයක තිබිය යුතු ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(iii) ළමා ගීතයකට සුදුසු පේළි හතරකින් යුත් පදමාලාවක් නිර්මාණය කරන්න. (ලකුණු 04)

(02) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

නිමල්කා සංගීතයට දක්ෂ සිසුවියකි. ඇයට "මුණි සිරිපාදේ සමනළ මුදුනේ" ගීතය වයලීනයෙන් වාදනය කළ හැකි ය. නරිබෑණා නාට්‍යයේ ඇහැළ මලින් ගස් පිරිලා ගීතයත් කලගෙඩි සෙල්ලමේ ගීතයත් නිවැරදිව මිහිරිව ගායනා කළ හැකි ය. බටහිර සංගීතයේ ස්වර හොඳින් ගායනා කිරීමට හැකි ය.

(අ) 'මුණි සිරිපාදේ සමනළ මුදුනේ' යන ගී පාදයේ ගුරු මාත්‍රා ගණන කීය ද? (ලකුණු 01)

(ආ) වයලීනයේ තත් ගණන කීය ද? (ලකුණු 01)

(ඇ) නිමල්කාට මිහිරිව ගායනා කළ හැකි ගීයක මුල්පේළි හතර ලියන්න. (ලකුණු 04)

(ඈ) බටහිර සංගීතයේ මුල් ස්වර හතර ගැයීමට, නිමල්කා යොදාගත් ලතින් අක්ෂර කවරේ ද? (ලකුණු 04)

(03) සංගීත භාණ්ඩ නොමැති අවස්ථාවල දී භාවිත කිරීමට අප අවට ඇති මෙවලම්වලින් ආදේශ භාණ්ඩ සකසා ගත හැකි ය.

(i) පන්ති කාමරයේ දී ඔබ විසින් නිර්මාණය කරන ලද ආදේශ භාණ්ඩ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ඔබ කැමැති ආදේශ භාණ්ඩයක් සකස් කරන අයුරු විස්තර කරන්න. (ලකුණු 06)

(iii) පිඹීමෙන් හඬ නිපදවන ආදේශ භාණ්ඩ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(04) (i) ස්වර පුවරුවේ රූප සටහනක් ඇඳ එහි ශුද්ධ ස්වර සප්තකය ලකුණු කරන්න. (ලකුණු 06)

(ii) ස්වර පුවරුවට සමාන සංගීත භාණ්ඩ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(iii) සරිග, රිගම මෙම ස්වර අභ්‍යාසය වැයීමට සුදුසු රිද්ම රටාව පෙන්වා දෙන්න. (ලකුණු 02)